# විශේෂ නිවේදනයයි

අභියෝගාත්මක සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සඳහා සහාය දැක්වීම

අභියෝගාත්මක සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපෑමට ලක් වූ මූලික වශයෙන් ශාක්‍යතාවයෙන් හෙබි ව්‍යාපාර යළි නඟා සිටුවීම සඳහා නැෂනල් ඩිවලොප්මන්ට් බැංකුව (National Development Bank PLC (NDB) ) විසින් අංග සම්පූර්ණ "ව්‍යාපාර නැවත නඟාසිටුවීමේ කළමනාකරණ අංශය" ක් ( Remedial Management Unit ) පිහිටුවා ඇත.

**අරමුණ:**

සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපෑමට ලක් වූ හා අනාගතයේදී බලපෑමට ලක්වන තත්වයෙන් ඇති ව්‍යාපාරික ගණුදෙණුකාර භවතුන් හඳුනා ගැනීම හා ඔවුන්ගේ ගැටළු ඇතිවිය හැකි ණය ආශ්‍රිත අවදානම් අවම කරගැනීම සහ කළමනාකරණය කරගැනීමේ අරමුණින් ඔවුන්ට සහාය දැක්වීමත් ඒ තුලින් එම ව්‍යාපාර තරඟකාරී සහ ඵලදායී ලෙස රටේ ආර්ථිකයට සක්‍රීයව දායක කර ගැනීම.

**විෂය පථය**

- ආපසු ගෙවීම පැහැර හැර ඇති ණය හා ආපසු ගෙවීම අතපසු වී ඇති ණය අධීක්ෂණය කිරීම සහ කළමණාකරණය කිරීම.
- ගැටළු සහගත ණය ආපසු අයකරගැනීම කළමනාකරණය කිරීම සඳහා අදාල අංශ වල හැකියාව සහ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම.

**කාර්යයන්/ක්‍රියාකාරකම්**

- ණය ප්‍රතිව්‍යුහගත කිරීම (Re-structuring) / ණය නැවත සැලසුම් කිරීම (Re-scheduling), ණය පහසුකම් ප්‍රතිසංවිධානය කිරීම (Re-organizing) යනාදී ව්‍යාපාර නඟා සිටුවීමට සුදුසු යාන්ත්‍රණ හඳුනා ගැනීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම.
- ණය ගණුදෙණුකරුවන්ගේ ව්‍යාපාර වල මෙහෙයුම් ප්‍රතිව්‍යුහගත කිරීම් සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.
- ව්‍යාපාර වාණිජමය වශයෙන් ස්ථාවර ව්‍යාපාර ලෙස යළි නඟා සිටුවීම සඳහා නව මාර්ගයන් හඳුනා ගැනීමට කටයුතු කිරීම
- ව්‍යාපාරයේ අභිවෘද්ධිය සහ නැවත නඟාසිටුවීම සඳහා නව්‍යකරණ විසඳුම් සමඟින් පිරිවැය කළමනාකරණය, මූල්‍ය විනය වැනි ව්‍යාපාරයේ දියුණුව සඳහා ඇති ක්ෂේත්‍ර හඳුනාගෙන ඊට අදාළ උපදේශන කටයුතු සැලසුම් කිරීම.

**අපව සම්බන්ධ කරගන්නා ආකාරය**

- කාර්යාල දුරකථන හෝ ජංගම දුරකථන අංක හරහා ඔබේ ව්‍යාපාර සම්බන්ධතා කළමනාකරු හෝ ශාඛා කළමනාකරු සමඟ සම්බන්ධ විය හැක.
- අපගේ පැය 24 පුරා ක්‍රියාත්මක 011 2448888/011 744888 දුරකථන අංක හරහා ද අපව ඇමතිය හැකියි.